# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,934/5 — 1970 දෙසැම්බර් 3 වැනි බ්‍රහස්පතින්ද — 1970.12.3**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

**(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)**

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී—බී. 18/68

උවිප්‍ර/1/7/17

**1968 අංක 16 දරන බුද්ධශ්‍රාවක ධර්මපීඨ පනත**

1968 අංක 16 දරන බුඩශ්‍රාවක ධර්මපීඨ පනතෙහි 13 වැනි සහ 18 වැනි වගන්ති යටතේ බුඩශ්‍රාවක ධර්මපීඨයේ අධ්‍යාපන හා පරිපාලන සභාව විසින් පනවනු ලැබ එකී පනතේ 18 (3) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධ්‍යාපන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබූ ලිඛිත ව්‍යවස්ථාවයි.

1970 නොවැම්බර් මස 30 වැනි දින,<br>කොළඹ දී ය.

ප්‍රේමදාස උඩගම,<br>අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

ලිඛිත ව්‍යවස්ථාව

1. මෙම ලිඛිත ව්‍යවස්ථාව අංක 4 දරන බුඩශ්‍රාවක ධර්මපීඨ ලිඛිත ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්විය හැකිය.

2. 1969 අප්‍රියෙල් මස 21 වැනි දින අංක 14,850/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1968 අංක 16 දරන බුඩශ්‍රාවක ධර්මපීඨ පනත යටතේ පනවනු ලැබූ අංක 2 දරන ලිඛිත ව්‍යවස්ථාව එහි වූ උප ලේඛණයෙහි '' බඳවා ගැනීමේ පරිපාටිය '' යන ශීර්ෂ පාඨය යටතේ වූ '' ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කිරීමෙන් '' යන වචන වෙනුවට එම ශීර්ෂ පාඨය යටතේ ඒවා සඳහා සෑම තැනකට '' දැන්වීම් ප්‍රසිද්ධ කිරීමෙන් '' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. 1969 ජූලි මස 18 වැනි දින අංක 14,862/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1968 අංක 16 දරන බුඩශ්‍රාවක ධර්මපීඨ පනත යටතේ පනවනු ලැබූ අංක 3 දරන ලිඛිත ව්‍යවස්ථාව, එහි වූ 5 වැනි වගන්තියෙහි '' මසකට දෙවරකට වැඩි නොවන ගණනක් '' යන වචන වෙනුවට '' සතියකට වරක් '' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12–385

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

910/13——ජේ 18759—11,175(70/11)